**තේ පර්යේෂණ මණ්ඩලය - 2021**

**----------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

තේ පර්යේෂණ මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යයසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද පිරිවැය රු.101,864,100 ක් වූ තේ පර්යේෂණ ආයතනයට අයත් මෝටර් රථ 92 ක්, ප්‍රත්‍යාගණන වටිනාකම රු. 12,168,584 ක් වූ ශාන්ත ජෝකිම් වතුයායට අයත් වාහන 10 ක්, පිරිවැය රු. 7,094,000 ක් වූ ශාන්ත කූම්බ්ස් වතුයායට අයත් වාහන 08 ක් සහ පිරිවැය රු.31,792,070 ක් වූ යන්ත්‍ර හා උපකරණ සමාලෝචිත වර්ෂය අවසානයේදී තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතියද රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි 92 (ආ) ඡේදය ප්‍රකාරව ඒ පිළිබඳව අනාවරණය කිරීමට කටයුතු කර නොතිබුණු අතර මෙම වත්කම් පිළිබඳ වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිති 03 ප්‍රකාරව සංශෝධනය කර නැවත මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | නුවරඑළිය ප්‍රධාන මෝටර් රථ පරීක්ෂක ඇතුළු තක්සේරු කමිටුව විසින් මේ වන විට තලවකැලේ මධ්‍යස්ථානය තුළ ඇති වාහන පරීක්ෂා කර තක්සේරු කටයුතු ආරම්භ කර ඇත. අනෙකුත් සියලු උප මධ්‍යස්ථානවල හා වතුයායන්වල ඇති වාහන තක්සේරු කිරීමේ කටයුතු 2022 වර්ෂය තුළ නිමකිරීමට බලාපොරොත්තු වන අතර අදාළ වාර්තා ලැබීමෙන් පසු ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද එහෙත් තවදුරටත් ප්‍රයෝජනයට ගනු ලබන වත්කම්වල ඵලදායි ජීව කාලය නැවත තක්සේරු කර ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි මෙහෙයුම් සහ ආයෝජන කටයුතු වලින් ජනිතවූ /යෙදවූ ශුද්ධ මුදල් ප්‍රවාහ ගණනය කිරීමේදී පිළිවෙලින් රු.3,340,023 ක් සහ රු.3,683,396 ක වටිනාකම් නිවැරදි නොවන ලෙස ගලපා තිබුණු අතර ගෙවන ලද පොලී වියදම් රු.4,123,220 ක් සහ ලද පොලී ආදායම් රු.4,518,953 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි වෙන වෙනම නිවැරදිව හෙළිදරව් කර නොතිබුණි. මෙම නිසා මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 02 හි නියමයන්ට අනුව පිළියෙල කර නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය. | රු.1,108,864.00 ලද පොලී සාවද්‍ය ලෙස ගිණුම් ගත කිරීමක් සිදු නොවී ඇති අතර විවිධ ආදායම් යටතේ රු.1,018,864.00ක් ආපදා ණය පොලී හා කුලී ආදායම්, මුදල් ලැබීම් පමණක් වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කිරීමෙන් සිදු වූ දෝෂයක් වන අතර සියලූ පොලී ලැබීම් (රු.4,518,953/-) සහ ගෙවීම් (රු. 4,123,220/-) අතපසුවීමකින්, වසර සඳහා වූ ශුද්ධ අතිරික්තය/හිඟය යටතේ පෙන්වා ඇති අතර එය 2022 වර්ෂයේ දී නිවැරදිව ආයෝජන ක්‍රියාකාරකම් යටතේ වෙන් වෙන් වශයෙන් පෙන්වීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 18 හි 16 ඡේදය ප්‍රකාරව ජෛව විද්‍යාත්මක වත්කම්වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කළ යුතු වුවද, තලවකැලේ , රත්නපුර, හන්තාන, පස්සර සහ කොට්ටව යන ප්‍රාදේශීය කාර්යාලවල පැවති වටිනා උස් සෙවන ශාක 5,654 ක් එසේ තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | 2022 අගෝස්තු 24 වන දින පැවති 2022/06 වැනි මණ්ඩල රැස්වීම් වාර්තාව අනුව තේ පර්යේෂණ ආයතනයේ 5,654ක් වන උස් සෙවණ ශාක තක්සේරු කිරීම සඳහා කමිටුවක් පත් කිරීම අනුමත කර ඇති අතර ඒ සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු ඇතුළු කමිටුවක් පත් කිරීමෙන් පසු එම ශාක තක්සේරු කිරීමේ කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වන අතර අදාළ වාර්තා ලැබීමෙන් පසු ගිණුම් කටයුතු සිදු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව ජෛව විද්‍යාත්මක වත්කම්වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| --------------------------- | ------------------------------------- | ------------ |
| (අ) 2021 වර්ෂයේ රු. 4,712,672 ක්වූ ආයෝජන පොලී ආදායම මත ගෙවියයුතු රු. 1,131,041 ක ආදායම් බදු මුදල ගිණුම්ගත කර නොතිබුණි. | ලද පොළී ආදායම මත ආදායම් බදු ගෙවීමට අවශ්‍ය ද යන්න පිළිබඳ කරුණු විමසා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අර්ථ නිරූපණ කමිටුවේ ලේකම් අංශය වෙත 2021.04.05 දින තේ පර්යේෂණ ආයතනය විසින් ලිපියක් යොමු කර ඇතත් මේ වන තෙක් පිළිතුරක් ලැබී නොමැත. එම නිසා නැවත විමසීමේ ලිපියක් 2022.09.08 දින යොමු කර ඇති අතර එම ලිපියට ලැබෙන පිළිතුරු මත පදනම්ව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට බලාපොරොත්තු වේ. | දේශීය ආදායම් පනත ප්‍රකාර ආයෝජන පොලී ආදායම මත ගෙවියයුතු ආදායම් බදු මුදල, ගිණුම්ගත කළ යුතුය. |
| (ආ)මණ්ඩලයේ ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුව ණයගැතියන් මත සියයට 05 ක අඩමාණ ණය වෙන් කිරීමේ දී , ශාන්ත කුම්බස් සහ ශාන්ත ජෝකිම් යන වතුයායන්ගේ ගිණුම්වල ඇතුළත් පිළිවෙලින් රු. 999,406 ක් සහ රු.406,143 ක් වූ විවිධ ණයගැති ශේෂය සම්බන්ධව වෙන්කිරීම් සිදුකර නොතිබුණි. | තේ පර්යේෂණ ආයතනයේ ණයගැති ශේෂයන්ට අදාළව අඩමාන ණය සඳහා සියයට 05 ක වෙන් කිරීමක් සිදු කිරීම ගිණුම්කරණ ප්‍රතිපත්තිය වේ. මණ්ඩලයේ අඩමාන ණය වෙන් කිරීමේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය, අතපසුවීමකින් ශාන්ත කුම්බ්ස් සහ ශාන්ත ජෝකිම් වතුයායන් සඳහා අදාළ කරගෙන නොතිබුණු අතර 2022 වර්ෂයේ සිට එම ප්‍රතිපත්තිය අදාළ කර ගෙන අවසන් ගිණුම් පිළියෙල කිරීමට කටයුතු කරනු ලැබේ. | ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව අඩමාන ණය වෙන් කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ)ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ලබාදී තිබුණු වාහන 03 ක් රු.7,413,550 කට ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද, එම වාහනවල අයිතිය තේ පර්යේෂණ මණ්ඩලය වෙත පවරා ගෙන නොතිබුණි. එසේම මේ පිළිබඳ සටහන් මඟින් හෝ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | දැනට ධාවන තත්ත්වයේ නොමැති මෙම වාහන තුන අලුත්වැඩියාව සඳහා යොමු කර, වායු විමෝචන වාර්තා ලබා ගෙන ආදායම් බලපත්‍ර ලබා ගැනීමෙන් පසු අයිතිය පවරාගැනීමට කටයුතු කරනු ලැබේ. ඉදිරියේ දී තේ පර්යේෂණ ආයතනය වෙත අයිතිය පවරාගෙන නොමැති වාහන පිළිබඳ ව ගිණුම් සටහන් තුළින් හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ. | කඩිනමින් වාහනවල අයිතිය පවරා ගත යුතුය. එය සිදුකරන තෙක් වාහන 3 පිළිබඳ සටහන් මඟින් හෙළිදරව් කළ යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා තේ පර්යේෂණ ආයතනයට තේ වතුවලින් ලැබිය යුතු විශ්ලේෂණ ආදායම රු. 346,320 ක් අයකරගැනීමට පියවර ගෙන නොතිබුණි. | 2022 වර්ෂය තුළ මෙම ශේෂය අය කිරීමට කටයුතු කරනු ලැබේ. | ලැබිය යුතු විශ්ලේෂණ ආදායම කඩිනමින් අයකර ගත යුතුය. |

**1.6.2 ගෙවිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශාන්ත කුම්බ්ස් වතුයායේ 2010 වසරේ සිට පැවත එන සහ වර්ෂ 02 ක ඉක්මවූ, විවිධ තොග සැපයුම්කරුවන් සඳහා ගෙවිය යුතු රු.1,791,492 ක ණයහිමි ශේෂ සමාලෝචිත වර්ෂය අවසාන වන තෙක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී මෙම ශේෂය නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. | මෙම ණයහිමි ශේෂයන් නිරවුල් කිරීමට හෝ හිමිකම් නොපාන බව තහවුරු වන්නේ නම් ආදායමට බැර කිරීමට පියවර ගත යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| මු.රෙ.571(3) | 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කොන්ත්‍රාත්වලින් රඳවාගන්නා ලද රු.3,551,559 ක මුදල් ප්‍රමාණයක් වසර 02ක් ඉක්මවා පැවතියද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | කොන්ත්‍රාත්වල පැවති අඩුපාඩුකම් හේතුවෙන් රැඳවුම් මුදල් නිදහස් නොකර ගිණුම්වල ඉදිරියට ගෙනවිත් ඇත.<br>මේ වන විට රු.2,623,897 ක මුදලක් නිරවුල් කර ඇති අතර, පෙන්වා දෙන ලද අඩුපාඩු සම්පූර්ණ කරන කොන්ත්‍රාත්කරුවන්ට තේ පර්යේෂණ ආයතනය විසින් රඳවා ගෙන ඇති වසර 02ක් ඉක්ම වූ ඉතිරි රු.927,662 ක රැඳවුම් මුදල් නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ. | නිරවුල් කිරීමට හෝ හිමිකම් නොපාන බව තහවුරු වන්නේ නම් ආදායමට බැර කිරීමට පියවර ගත යුතුය. |
| මු.රෙ. 756 (9) | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර අවසන් කිරීමේ කාල රාමුව අනුව මණ්ඩලය 2021 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ඉදිරි මුදල් වර්ෂයේ ජුනි 15 දිනට පෙර විගණකාධිපති වෙත යොමු කළ යුතු වුවත්, 2022 ජුලි 31 විගණන දින වන විටත් එසේ කටයුතු කර නොතිබුණි. | 2021 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ කටයුතු මෙතෙක් අවසන් වී නොමැත.ප්‍රවාහන පහසුකම් සපයා ගැනීමේ ගැටළුව මත උප මධ්‍යස්ථානයන් වෙතින් අපහරණය කිරීමට නියමිත භාණ්ඩ පරීක්ෂා කිරීමේ හා එක් රැස් කිරීමේ කටයුතු ද ප්‍රමාද වී ඇත.<br>ඉහත කටයුතු නිම කර 2022 වසර අවසන් වීමට පෙර අදාළ වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත යොමු කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.3 වගන්තිය | වැඩ බැලීමේ පත්කිරීමක් කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක්, තාවකාලික පදනමට වුවත් මණ්ඩලයේ අතිරේක අධ්‍යක්ෂ තනතුර, ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී තනතුර, | අතිරේක අධ්‍යක්ෂ තනතුර පිරවීම සඳහා 2021 පෙබරවාරි මස 01 වන දින සම්මුඛ පරීක්ෂණ පවත්වා 2021.04.05 දින තෝරා පත් කර ගෙන ඇත.<br>ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී | අනුමත තනතුරු සඳහා වැඩබැලීමේ පත්කිරීම් වෙනුවට ස්ථිර පත්කිරීම් සිදු කළ යුතුය. |

ඉංජිනේරු තනතුරු 01 ක්, අංශ ප්‍රධානී තනතුරු 04 ක් සහ තවත් තනතුරු 04 ක් වර්ෂ 01සිට වර්ෂ 09 දක්වා නිත්‍ය පත්වීමක් සිදුනොකර තාවකාලික වැඩ බැලීමේ පදනම මත පත්කිරීම් කර සමාලෝචිත වර්ෂයේදී රු.1,508,773 ක වැඩ බැලීමේ දීමනා ගෙවා තිබුණි.

තනතුර සඳහා තෝරා ගන්නා ලද අයදුම්කරු 2022 මාර්තු 02 දින සිට තේ පර්යේෂණ ආයතනයේ සේවයේ නිරතව සිටී.

නේවාසික ඉංජිනේරු තනතුර පිරවීම සඳහා තෝරා පත් කර ගත් අයදුම්කරුවන් සහ පොරොත්තු ලේඛනයේ අනෙකුත් අයදුම්කරුවන් ද පත්වීම භාර ගැනීම ප්‍රතික්ෂේප කරන ලදී.

අංශ ප්‍රධානි තනතුරු 04 අභ්‍යන්තර උසස්වීම් වන අතර සුදුසුකම් සහිත අභ්‍යන්තර අයදුම්කරුවන් නොමැති හෙයින් වැඩ ආවරණය කිරීමේ පදනම මත නිලධාරීන් පත්කිරීම සිදු කර ඇත. ජාල පද්ධති පරිපාලක යන තනතුර සඳහා 2021.05.03 දින බඳවා ගත් නිලධාරී 2021.08.27 දින සේවයෙන් ඉල්ලා අස් වී ඇත.

තාක්ෂණික (MA 2-2) කළමනාකරණ සහකාර සහ කළමනාකරණ සහකාර (ගබඩා) පුරප්පාඩු පිරවීමට අයදුම්පත් කැඳවා ඇති නමුත් BD/CBP/01/01/04 හා 2022.04.26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 මගින් රාජ්‍ය අංශයේ තනතුරුවලට බඳවා ගැනීම් තාවකාලිකව අත්හිටුවීමට උපදෙස් ලබා දී ඇති බැවින් කළමනාකරණ සහකාර (ගබඩා) තනතුරේ රාජකාරී ඉටු කිරීමේ පදනම මත (Attending to the Duties) නිලධාරියෙකු පත්කිරීම සිදු කර ඇත. සේවා අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය මඟින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ විශේෂ අනුමැතියක් මත බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු ඉදිරියේ දී සිදු කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| (ඇ) අංක පීඊඩී / 12 හා 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය | මුදල් ආයෝජනයේදී මුදල් අමාත්‍යවරයාගේ හා අදාළ අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවත්, 2021 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය විසින් රු. 81,980,000 ක් කෙටිකාලීන තැන්පත්වල ආයෝජනය කිරීමේදී එපරිද්දෙන් අනුමැතියක් ලබාගෙන නොතිබුණි. | තේ පර්යේෂණ ආයතනයේ පාරිතෝෂික දීමනා සඳහා 2008 වර්ෂය තෙක් පවත්වාගෙන එන ලද අරමුදල් සහ ශාන්ත ජෝකිම් වතුයායේ ආදායම් වලින් සැදුම්ලත් 2021 වර්ෂයට අදාළ රු.81,980,000 ක ස්ථාවර තැන්පත් මුදල සඳහා 2008 වර්ෂයේදී සහ 2013 වර්ෂයන්වල දී තේ පර්යේෂණ මණ්ඩල අනුමැතිය ලබාගෙන කෙටි කාලීන තැන්පතු වල ආයෝජනය කර ඇත. ඉදිරියේ දී අදාළ අනුමැතින් ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | මුදල් ආයෝජනය කිරීමේදී මුදල් අමාත්‍යවරයාගේ හා අදාළ අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතුය. |
| (ඈ) අංක පීඊඩී/12 හා 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.14 වගන්තිය | මානව සම්පත් කළමනාකරණය සඳහා නීති රීති සම්පාදනය කිරීමට අදාළ කාර්ය පරිපාටි අත්පොතක් සකස්කර භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතු වුවද, මණ්ඩලය විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මේ වන විට ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් කාර්යාලීය අත්පොත සැකසීම සඳහා මිළ ගණන් කැඳ වූ අතර ඒ අනුව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) මගින් කාර්යාලීය අත්පොත සැකසීම සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු (සුළු) අනුමැතිය ලැබී ඇත. ඒ අනුව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයට (SLIDA) මාස 03 ක් ඇතුලත කාර්යාලීය අත්පොත සැකසීම නිම කරන ලෙසත් දන්වා ඇත. ඒ අනුව කාර්යාලීය අත්පොත සකස්කර මහා භාණ්ඩාගාරයේ අනුමැතියට යොමු කිරීමට බලාපොරොත්තු වේ. | නොපමාව මානව සම්පත් කළමනාකණය සඳහා පරිපාටි රීති සකස් කර භාණ්ඩාගාර අනුමැතියට ඉදිරිපත් කළ යුතුය. |

**2 මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.70,206,000 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.48,058,726 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.22,147,274 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සාන්ත ජෝකිම් වතුයායේ හා ශාන්ත කුම්බ්ස් වතුයායේ ඌනතාවය ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.34,291,896 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන් වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් වියදම් විෂයයන් ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත පරිදි වේ.

| විෂය | 2021<br>රු. 000 | 2020<br>රු.000 | විචලනය වාසි/( අවාසි)<br>සියයට |
|---|---|---|---|
| **ආදායම්** | | | |
| මුළු ආදායම | 437,774 | 477,732 | (8) |
| අනෙකුත් ආදායම් | 23,037 | 29,235 | (21) |
| ශාන්ත ජෝකිම් හා ශාන්ත කුම්බිස් වතු 02 හි අලාභය | 52,662 | 18,370 | (187) |
| **වියදම්** | | | |
| අනෙකුත් වියදම් | 3,613 | 1,934 | (87) |

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අනෙකුත් ආදායම් සියයට 21 කින් පහළ ගොස් තිබූ අතර ඒ සඳහා විශ්ලේෂණාත්මක සේවා මත ආදායම් සියයට 40 කින් හා ආයෝජන මත පොලිය සියයට 30 කින් අඩුවීම බලපා තිබුණු අතර ශාන්ත ජෝකිම් හා ශාන්ත කුම්බිස් වතුයායන්හි අලාභය සියයට 187 කින් වැඩි වී තිබීම ප්‍රධාන වශයෙන් ආදායම සියයට 8 කින් අඩුවීමට බලපා තිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

ඉකුත් වර්ෂයේ වාර්තා කරන ලද 2.25:1 වන ජංගම අනුපාතය, සමාලෝචිත වර්ෂයේදී 3:1 වශයෙන් සහ ක්ෂණික වත්කම් අනුපාතය පෙර වර්ෂයෙහි වූ 1.6 : 1 අනුපාතයට සාපේක්ෂව 2.2 : 1 ක් වශයෙන් ඉහල යාමක් නිරීක්ෂණය වේ. මෙම අනුපාතයන් දෙකෙහිම ඉහල යාම සඳහා පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 130 කින් සමාලෝචිත වර්ෂය අවසානයට මුදල්, මුදල් සමාන දෑ ඉහල යාම සෘජුවම බලපෑම් කර ඇති බව නිරීක්ෂණය වේ. මුදල්, මුදල් සමාන දෑ වඩා ඉහල මූල්‍ය ලාභයක් ජනිත වන ආකාරයට ආයෝජනයන් සිදු කරමින් වඩාත්ම සුදුසු ක්ෂණික වත්කම් අනුපාතය වන 1:1 මට්ටමක පවත්වා ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 නොවැම්බර් 24 දින රු.12,554,583 ක් වැය කර ඉන්දියාවෙන් මිලදීගත් විශේෂ ව්‍යාපෘති සඳහා වූ උපකරණයක් (Walk in Type Environmental Controlled Facility) වසර හතරක් ගත වී තිබුණද එම උපකරණය ස්ථාපනය හා සවිකිරීම නිසි පරිදි සිදුකිරීමට නොහැකිවීම හේතුවෙන් ක්‍රියාකාරීත්වය අපේක්ෂිත මට්ටමට නොපැවතීම නිසා පර්යේෂණ සඳහා භාවිතා කළ නොහැකිව පැවතුණි. | ඉහත කරුණ සම්බන්ධයෙන් බේරුම්කාර මණ්ඩලයේ පැමිණිල්ල ගොනුකිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදුකර ඇත. ඒ අනුව විත්තිකාර පාර්ශවය විසින් දිවුරුම් ප්‍රකාශයක් මගින් බේරුම්කාර මණ්ඩලයට කරුණු ඉදිරිපත් කර එහි පිටපතක් ආයතනය වෙත යොමුකර ඇත. එම දිවුරුම් ප්‍රකාශය නීතිපති වෙත යොමු කිරීමට කටයුතු කර ඇති අතර, මේ සම්බන්ධ නීතිමය කටයුතු නිම වීමෙන් පසු අදාළ ගිණුම්කරණ කටයුතු සිදු කරනු ලැබේ. | නීතිමය ක්‍රියාමාර්ග කඩිනම් කර අලාභ අයකර ගත යුතුය. |

මෙම මිලදී ගැනීමට සම්බන්ධ ප්‍රසම්පාදන හා තාක්ෂණික කමිටුවලට විරුද්ධව ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණු අතර මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් අමාත්‍යාංශයෙන් ලද මුදලින් මෙම වියදම් දැරූ පසු ඉතිරි වූ මුදල වන රු.3,454,050 ක් මූල්‍ය ප්‍රකාශන තුළ කෙරීගෙන යන ව්‍යාපෘති යටතේ දක්වා තිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) වලහන්දූව, දෙණියාය සහ කොට්ටව යන ප්‍රාදේශීය කාර්යාලවල 2010 වර්ෂයට පෙර රු. 72,031,804 ක් වැයකර ගොඩනැගිලි ඉදිකර තිබුණද එම ඉඩම්වල අයිතිය පිළිවෙලින් රාජ්‍ය වැවිලි සංස්ථාව, තලවකැලේ වැවිලි සමාගම සහ රජය සතු වන අතර මණ්ඩලය වෙත පවරා ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි. | 2019 වර්ෂයේදී වලහන්දූව වත්ත ගැසට් නිවේදනයක් මගින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පවරාගෙන ඇත. එම තීරණයට විරුද්ධව ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව විසින් මේ වනවිට අභියාචනාධිකරණයේ ඇපැලක් ගොනුකර ඇත. දැනට තේ පර්යේෂණ ආයතනය පාංශු හා ශාක පෝෂණ විශ්ලේෂණාගාර භූමි කොටස සමඟ වලහන්දූව වත්ත ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව යටතට ගෙන ඇති බැවින්, අභියාචනාධිකරණ නියෝගය ලැබෙන තෙක් තේ පර්යේෂණායතනය විසින් භුක්ති විඳින හෙක්ටයාර් 1 කට වැඩි භූමි කොටසේ නීත්‍යානුකූල අයිතිය ලබාගැනීමට නොහැකි වී ඇත.<br>කොට්ටව උපදෙස් හා ව්‍යාප්ති මධ්‍යස්ථානය විසින් පරිහරණය කරනු ලබන ඉඩම් කොටස දීර්ඝකාලීන බදු පදනම මත ලබාගැනීමට අවශ්‍ය සියළු කටයුතු මේ වනවිට අවසන් කර ඇති අතර, යක්කලමුල්ල සහකාර ප්‍රාදේශීය ලේකම් පැමිණ ඉඩම පරික්ෂා කර නිර්දේශ ලබා දී ඇත.<br>දෙනියාය උපදෙස් හා ව්‍යාප්ති මධ්‍යස්ථානය පවත්වාගෙන යනු ලබන තලවකැලේ වැවිලි සමාගමට අයත් දෙනියාය වතුයායේ ඉහල කොටසේ ක්ෂේත්‍ර අංක 2 හි අක්කර 5යි, රූඩ් 2යි, පර්චස් 1.95ක හිස් බිම් කොටසේ නීත්‍යානුකූල අයිතිය පවරාගැනීම සම්බන්ධයෙන් කොටපොල ප්‍රාදේශීය ලේකම්වරිය හමුවූ අතර, ඇය පවසා සිටියේ එම ඉඩම් කොටස මුලින් රජයට | අදාළ ඉඩම්වල අයිතිය මණ්ඩලයට පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

පවරාගෙන රජය විසින් ඉඩමේ නීත්‍යානුකූල අයිතිය ආයතනය වෙත පැවරීමට කටයුතු කළ යුතු බවයි. ඒ අනුව ඉඩමේ වර්තමාන තක්සේරු වාර්තාවක් ලබාගෙන ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය වැවිලි හා කර්මාන්ත අමාත්‍යාංශය මගින් දකුණු පළාත් ඉඩම් කොමසාරිස් වෙත යොමුකිරීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත.

(ආ)සම්පූර්ණ වැටුප් සහිත විදේශ අධ්‍යන නිවාඩු ලබා විදේශගතව නැවත සේවයට නොපැමිණි සහ සේවයට පැමිණීමෙන් පසු අනිවාර්ය සේවාකාලය අවසන් වීමට පෙර සේවය අතහැර ගිය නිලධාරීන් 04 දෙනෙකු 2005 සිට 2009 වර්ෂවලදී මණ්ඩලය සමඟ එළඹ තිබුණු ගිවිසුම් කඩකිරීම හේතුවෙන් අදාළ බැඳුම්කර වටිනාකම වූ රු.15,054,891 ක් 2021 වර්ෂය අවසානය දක්වා ආපසු අයකර ගැනීමට නොහැකි වී තිබුණි. මණ්ඩලය විසින් නීත්‍යානුකූලව නඩු පවරා තිබුණද චූදිතයන් සොයා ගැනීමට නොහැකි වීම නිසා 2011 වර්ෂයේ සිට නඩු 02 ක් උසාවිය විසින් බහා තබා තිබුණි.

බැඳුම්කර ගිවිසුම් උල්ලංඝනය කරමින් නැවත සේවයට නොපැමිණි නිලධාරින් 04 දෙනාට විරුද්ධව නඩු පවරා ඇත.
ප්‍රධාන විත්තිකරු වන ආචාර්ය. ඩී පී බී හේරත්/හිටපු පර්යේෂණ සහකාර විදේශගත වී ඇත. ඇපකරුවන්ට විරුද්ධව කොළඹ දිසාධිකරණයේ අංක DMR/4019/11 යටතේ ගොනුකර තිබූ නඩුව අවසානයේ තීන්දුව දී තිබුණද එම තීන්දුවට විරුද්ධව එරෙහිව එම ඇපකරුවන් විසින් ඇපැලක් ගොනුකර ඇත.
ප්‍රධාන විත්තිකාරිය ආචාර්ය. බී ඒ පී කුරේ මිය - හිටපු පර්යේෂණ සහකාර මියගොස් ඇත. ඇපකරුවන්ට විරුද්ධව නඩු පවරා ඇත. ප්‍රධාන ණයකරු හා ඇපකරුවෙකු මේ වනවිට මියගොස් ඇති බැවින්, ඉතිරිව ඇති එක් ඇපකරුවෙකුට විරුද්ධව නඩුව පවත්වාගෙන යාමට ඇති හැකියාව පිළිබඳ විමසීමට නඩු ගොනුව නීතිපති වෙත යොමුකර ඇත.
ප්‍රධාන විත්තිකරු ආචාර්ය සම්පත් වල්ගම මහතා - හිටපු පර්යේෂණ සහායක විදේශගත වී ඇත. ඔහුට හා ඇපකරුවන්ට විරුද්ධව නඩු පවරා ඇත. ඇපකරුවන් දෙදෙනා මියගොස් ඇති අතර, ප්‍රධාන විත්තිකරු නොමැති බැවින් නඩුව බහ තබා ඇත. කෙසේ වුවද සම්පත් වල්ගම මහතා දැනට Lethbridge College, Faculty of Agriculture, Canada යන ස්ථානයේ උපදේශකවරයෙකු ලෙස රැකියාවක නිරතව සිටින බවට කරුණු තහවුරු වූ බැවින්, ඔහු වෙනුවෙන් වැයකර ඇති රු. 4,409,891 මුදල නැවත කඩිනමින් ආයතනය වෙත ගෙවන ලෙසට ලිඛිතව දන්වා යවා ඇත. එම ලිපියට පිළිතුරක් මෙතෙක් ලැබී නොමැත. ඒ සම්බන්ධයෙන් නීතිපති වෙත කරුණු යොමුකිරීමෙන් අනතුරුව නීතිපති විසින් වල්ගම මහතාට

චූදිතයින් පිළිබඳ තොරතුරු සොයා ගැනීම සඳහා ගතහැකි විකල්ප ක්‍රම සොයා බලා ක්‍රියාත්මක කිරීම කළ යුතුය.

| | | |
|---|---|---|
| | එන්තරවාසි යැවීම සඳහා අවශ්‍ය කටයුතු කරමින් පවතී. ප්‍රධාන විත්තිකරුට ලලිත් ගුණතිලක මහතා - හිටපු අත්හදා බැලීමේ නිලධාරීට විරුද්ධව නඩුවක් ගොනුකර ඇත. එම නඩුව අවස්ථා 11ක් අධිකරණය ඉදිරියේ කැඳවා ඇති අතර, ඒ කිසිඳු අවස්ථාවක විත්තිකරු අධිකරණයේ පෙනී සිට නොමැත. එම හේතුවෙන් නඩුව බහා තබා ඇත. | |
| (ඇ) රාජකාරී වේලාව තුළ සිදු වූ විනය පරීක්ෂණයකට හේතු වන විෂමාචාරයක් සම්බන්ධයෙන් එම චූදිතයන් දෙදෙනාගෙන් එක් අයෙක් අදාළ සිදුවීම හෙළිවීමත් සමඟ ආයතනයේ සේවයෙන් ඉල්ලා අස්වීම සඳහා ලිපියක් එවා තිබුණු අතර ආයතන සංග්‍රහයෙහි V පරිච්ඡේදයේ 4.1 වගන්තියට පටහැනිව එම ඉල්ලා අස්වීම ආයතනයේ අධ්‍යක්ෂවරයා විසින් භාරගෙන තිබුණි. මූලික සහ විධිමත් පරීක්ෂණ කටයුතු සඳහා ඔහු කැඳවීමට හෝ ප්‍රකාශ ලබා ගැනීමට ඒ අනුව ආයතන ප්‍රධානියා කටයුතු කර නොතිබුණි. | රාජකාරී වේලාව තුළ සිදු වූ විෂමාචාරයක් සම්බන්ධයෙන් 2019.05.29 දින මූලික විමර්ශන නිලධාරියෙකු පත් කර මූලික විමර්ශණයක් සිදු කර ඇත. ඒ අනුව එක් සේවයෙකු හට චෝදනා පත්‍රයක් ද නිකුත් කර ඇත.<br>එම සිද්ධිය හා සම්බන්ධ අනෙක් පුද්ගලයා මූලික විමර්ශණය පැවැත්වීමට පෙර එනම්, 2019.04.17 දිනැති ලිපියක් මගින් ආයතනයේ විනය බලධරයා වෙත තමාගේ ඉල්ලා අස්වීම ෆැක්ස් මගින් යොමු කර ඇත.<br>තේ පර්යේෂණ ආයතනය අධ්‍යක්ෂ විසින් ඉල්ලා අස්වීම ප්‍රතික්ෂේප කිරීමට තරම් හේතු වන කාරණා නොමැති බැවින් 2019.04.24 දිනැති ලිපිය මගින් එම ලිඛිත ඉල්ලා අස්වීම අනුමත කොට ඇත. තේ පර්යේෂණ ආයතනය විසින් ඉල්ලා අස් වූ චූදිත නිලධාරියා ප්‍රකාශයක් ලබා ගැනීමට 2019.07.15 දින තේ පර්යේෂණ ආයතනයට පැමිණෙන ලෙස 2019.07.08 දිනැති ලිපිය මගින් ඉල්ලීමක් සිදු කළ ද ඔහු 2019.07.14 දිනැති ලිපිය මඟින් පැමිණීමට නොහැකි බව දන්වා ඇත. | විනය පරීක්ෂණයකට මුහුණ දීමට නියමිතව ඇති නිලධාරියකුගේ ඉල්ලා අස්වීම භාරගත් අධ්‍යක්ෂවරයාට එරෙහිව විනය පියවර ගත යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශාන්ත කූම්බ්ස් හා ලැමිලියා වතුයායේ ක්‍රියාකාරී ගිණුම (Working Account) අනුව වතුයායේ ඉකුත් 2018 වර්ෂයෙන් පසුව අඛණ්ඩව අලාභ තත්ත්වයක් වාර්තා වන අතර එය සමාලෝචිත වර්ෂය වන විට රු.41,052,214 ක අලාභයක් දක්වා, එනම් පසුගිය වර්ෂය හා සැසඳීමේදී සියයට 234 කින් අලාභදායි තත්ත්වය ඉහළ | 2021 වර්ෂයේ මාර්තු මස 04 වැනි දින සිට වතු සේවකයන්ගේ දෛනික වැටුප රු.1,000ක් දක්වා ඉහළ ගිය බැවින් එය සෘජුවම වතුයායේ නිෂ්පාදන පිරිවැය ඉහළ යැමට බලපාන ලදී. ඒ අනුව පාරිතෝෂික දීමනා සඳහා වෙන් කිරීම් ද සේවකයින් සේවය කරන ලද මුළු කාල සීමාව සඳහා සකසා රු.24,238,454 ක වටිනාකමක් ගිණුම් ගත කර ඇත.<br>එමෙන්ම 2021 වර්ෂයේ පැවති කෝවිඩ් 19 | මනාව ආදායම් සහ වියදම් කළමනාකරණය කිරීම තුළින් ලාභදායීත්වයක් ලඟාකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| යාමක් නිරීක්ෂණය වේ. තවද 2018 වර්ෂයෙන් පසුව තේ කිලෝ 01ක ශුද්ධ විකුණුම් සාමාන්‍ය (NSA) සහ තේ කිලෝ 01 ක නිෂ්පාදන පිරිවැය (COP) සැසඳීමේදී අඛණ්ඩව නිෂ්පාදන පිරිවැය ඉහළ යාමක් පෙන්නුම් කරනු ලබන අතර සමාලෝචිත වර්ෂයෙහි තේ කිලෝ 01 ක අලාභය රු.222 ක් තරම් වැඩි අගයක් වාර්තා කර ඇති බව තවදුරටත් නිරීක්ෂණය විය. | වසංගත තත්ත්වය හේතුවෙන් ශාන්ත කුම්බිස් වතුයාය මැයි මස සිට ජුනි දක්වා හුදෙකලා කර පැවතිණි. එම කාලය තුළ මේරූ තේ දළු කපා ඉවත් කිරීම සඳහා ද අමතර පිරිවැයක් දැරීමට සිදු වූ අතරම එම අත්‍යාවශ්‍ය කප්පාදුව හේතුවෙන් මාස කිහිපයක්ම තේ දළු අඩු වීමට බලපාන ලදී. එමෙන්ම 2021 වර්ෂයේ පැවති අයහපත් ආර්ථික තත්ත්වය මත තේ විකුණුම් මිල ඉහළ යෑමක් ද සිදු නොවූ බැවින් ශුද්ධ විකුණුම් සාමාන්‍ය අගය වැඩි වීමක් සිදු නොවීය. | |
| (ආ) ශාන්ත කුම්බිස් හා ලැම්ලියා වතුයායේ ඉකුත් වර්ෂයේ රු. 52,574,301 ක් වූ දේශීය තේ විකුණුම් ආදායම සමාලෝචිත වර්ෂයේ රු.34,587,956 ක් වූ අතර පෙර වර්ෂය හා සැසඳීමේදී එය රු.17,986,345 කින් එනම් සියයට 34 කින් අඩුවීම, ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ වූ මව් වගා ව්‍යාපෘතියේ ලාභය සහ තේ මධ්‍යස්ථානයේ ලාභය පසුගිය වර්ෂයට සාපේක්ෂව රු.1,217,158 න් අඩුවීම සමාලෝචිත වර්ෂයේ සිදුවූ ඉහළ අලාභදායි තත්ත්වය සඳහා සෘජුවම බලපා තිබුණු බව නිරීක්ෂණය විය. | 2021 වර්ෂය පුරා රට තුළ පැවති කෝවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් තේ නිෂ්පාදනය සැලකිය යුතු ලෙස පහළ යෑම දේශීය තේ විකුණුම් ආදායම පහළ යෑමට බලපා ඇත. ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ වූ මව් වගා ව්‍යාපෘතියේ තේ රිකිලි අලෙවිය සැළකිය යුතු මට්ටමකින් අඩු වීමට 2021 වර්ෂය පුරා රට තුළ පැවති කෝවිඩ් 19 වසංගත තත්ත්වය බලපෑ අතර ඒ හේතුවෙන් මව් වගා ව්‍යාපෘතියේ ලාභය අඩු වී ඇත. එසේම ශාන්ත කුම්බිස් වතුයාය මැයි මස සිට ජුනි දක්වා හුදෙකලා කර පැවතීම හේතුවෙන් තේ විකුණුම් මධ්‍යස්ථානයේ තේ අලෙවි කටයුතු සිදු නොවුණු හෙයින් පෙර වර්ෂයට සාපේක්ෂව ලාභය ද අඩු වී ඇත. | මනාව ආදායම් සහ වියදම් කළමණාකරනය කිරීම තුළින් ලාභදායීත්වයක් ලඟාකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) වාර්ෂිකව නිමි තේ කි.ග්‍රෑම් 1,020,000 ක සමස්ත කර්මාන්තශාලා ධාරිතාවයකින් යුතු ශාන්ත ජෝකිම් වතුයායේ පසුගිය වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී එම ධාරිතාවයෙන් සියයට 72 සිට 85 ක් දක්වා ඌන ධාරිතාවයකින් ක්‍රියාත්මක වූ බව නිරීක්ෂණය විය. නැවත වගාව සඳහා ආයතනය අවධානය යොමුකිරීම අඩුවීම මෙම ඌන උපයෝජන තත්ත්වය ඇතිවීමට බලපා තිබුණු බව නිරීක්ෂණය කෙරේ. | කර්මාන්තශාලාවේ යන්ත්‍රෝපකරණවල පැවති අඩුපාඩු නිවැරදි කරන තෙක් සහ කාරක ප්‍රාග්ධනය හිඟ වීම මත කර්මාන්තශාලාවේ අලාභය අවම කිරීම සඳහා අඩු ධාරිතාවයකින් ක්‍රියාත්මක කිරීමටත් වර්ණ විභේදක යන්ත්‍රය ස්ථාපිත කර ඒ තුළින් ලැබෙන මිල මත ධාරිතාවය වැඩි කිරීමටත් වතු පිළිබඳ උපදේශන කමිටුව නිර්දේශ කර තිබුණි.<br>නිමි තේ වල ගුණාත්මකභාවය වැඩි කර ගැනීම සඳහා අවශ්‍ය වර්ණ විභේදක යන්ත්‍රය 2021 ඔක්තෝබර් මස මිලදී ගත් අතර ඒ තුළින් වතුයායේ නිමි තේ වල ගුණාත්මකභාවය වැඩි වී ඇත.<br>වතු පිළිබඳ උපදේශන කමිටු නිර්දේශ මත දෛනික අමු තේ දළු යෙදවුම් කිලෝ ග්‍රෑම් 3,000-3,500ත් අතර ධාරිතාවයකින් පසුගිය වර්ෂයේ කර්මාන්ත ශාලාව | නැවත වගාවට සහ පාළු වගාවට අවශ්‍ය ප්‍රාග්ධන ප්‍රතිපාදන වැඩි කර ගැනීමට ක්‍රියා කළ යුතුය. |

| | | |
|---|---|---|
| | ක්‍රියාත්මක කළ අතර මේ වන විට එම කමිටු නිර්දේශය මත දෛනිකව අමු තේ දළු යෙදවුම් කිලෝ ග්‍රෑම් 5,000ක් දක්වා වැඩි කිරීමට කටයුතු කර ඇත.<br>තවද රත්නපුර ප්‍රදේශයේ තේ නිෂ්පාදන කම්හල් වැඩි වශයෙන් ඇති අතර පුද්ගලික අංශයේ තේ කම්හල් සමග තේ දළු සඳහා දැඩි තරඟකාරිත්වයකට මුහුණ දෙමින් අවම කාරක ප්‍රාග්ධනයක් යටතේ අමු තේ දළු මිළදී ගැනීමට සිදුවීම ද කර්මාන්ත ශාලාව අවම ධාරිතාවයෙන් ක්‍රියාත්මක කිරීමට බලපා ඇත.<br>ඒ අනුව ඉදිරියේ දී ආදායම වැඩි කර ගැනීමටත් කර්මාන්තශාලාව ප්‍රශස්ත ධාරිතාවයෙන් පවත්වාගෙන යාමටත් බලාපොරොත්තු වේ.ප්‍රාග්ධන ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් නැවත වගා කටයුතු වසර ගණනාවකින් සිදු කිරීමට නොහැකි වී ඇත.2022 වර්ෂයේ දී හෙක්ටයාර 5.02ක තේ වගා කිරීම සඳහා මූලික කටයුතු සිදු කර ඇත. | |

## 3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)තේ පර්යේෂණ ආයතනයේ කාර්ය මණ්ඩල අර්ථසාධක අරමුදල 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 27 (1) වගන්තිය යටතේ 1959 ජූනි 01 වැනි දින සිට අනුමත අර්ථසාධක අරමුදලක් ලෙස 2014 ඔක්තෝබර් 30 දින කම්කරු කොමසාරිස් විසින් සහතික කර තිබුණි. මෙම අර්ථසාධක අරමුදලේ කළමනාකරණ නීති සංග්‍රහයේ 4 ( i ) වන වගන්තිය ප්‍රකාරව අරමුදලේ භාරකාර මණ්ඩලය, තේ පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂවරයා (භාරකාර මණ්ඩලයේසභාපති), අධ්‍යක්ෂවරුන් 02 ක් හා අරමුදලේ සාමාජිකයින් දෙදෙනෙකුගෙන්ද ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් නම් කළ අරමුදලේ සාමාජිකත්වය නොදරන නිලධාරින් දෙදෙනෙකුද ඇතුළුව සාමාජිකයන් 07 ක් ගෙන් සමන්විත විය යුතු වුවද, එයින් බැහැරව ණය මුදල් ලබා ගැනීමේදී හෝ සාමාජිකයෙකුගේ සාමාජිකත්වය ඇවර | තේ පර්යේෂණ ආයතන කාර්යය මණ්ඩල අර්ථසාධක අරමුදල් ව්‍යවස්ථාවේ සඳහන් භාරකාර මණ්ඩල සාමාජික සංඛ්‍යාව පිළිබඳව පැන නැඟී තිබූ ගැටලුකාරී තත්ත්වය නිරාකරණය කිරීම සඳහා 2021.12.31 දින පැවැත් වූ මහා සභා රැස්වීමේදී, භාරකාර මණ්ඩලයේ සාමාජික සංඛ්‍යාව සංශෝධනය කිරීමට අදාළ යෝජනාව සම්මත කර ගෙන ඇති අතර එම සංශෝධිත ව්‍යවස්ථාව අනුමැතිය සඳහා 2022.06.23 සහ 2022.07.25 යන දිනැති ලිපි මඟින් කම්කරු කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. මේ සම්බන්ධයෙන් වැඩිදුරටත් විමසීම් සිදු කරමින් පවතින අතර හැකි ඉක්මණින් සංශෝධිත වාර්තාව ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | පවත්නා ගැටලුකාරී තත්ත්වය විසඳාගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| කරන අවස්ථාවේදී අනවශ්‍ය කාලයක් ගත වීමත්, ලිපිලේඛන අස්ථානගතවීම් සිදුවිය හැකි වීමත්, ආයතනයේ ගැටලුකාරී තත්ත්වයන් බාහිර පාර්ශවයක් වෙත යාම වැනි කරුණු හේතුවෙන් බාහිර සාමාජිකයින් දෙදෙනෙකුගේ අවශ්‍යතාවයක් නොමැති බව දක්වමින් තේ මණ්ඩලයේ සාමාජිකයින් දෙදෙනා මේ දක්වා මෙම කමිටුවට ඇතුළත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. මෙම ගැටලුව විසඳා ගැනීමට මණ්ඩලය ඵලදායි පියවරක් නොගෙන අර්ථසාධක අරමුදලේ කටයුතු ඉදිරියට කරගෙන එමින් පැවති බව නිරීක්ෂණය විය. | | |
| (ආ) ශාන්ත කූම්බ්ස් වතුයායේ අභ්‍යන්තර පාලන දුර්වලතා හේතුවෙන් 2017 වර්ෂයේ දී සිදුව තිබුණු මූල්‍ය වංචාවක් නිසා අහිමි වූ මුදල රු. 10,276,628 ක් ණයගැති ශේෂය තුළ පවතින නමුත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා මුදල් රෙගුලාසි ප්‍රකාර පරීක්ෂණ කටයුතු අවසන් කර අලාභ අයකරගැනීමට හෝ විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට අපොහොසත්ව තිබීම මතභේදාත්මක කරුණක් ලෙස නිරීක්ෂණය කෙරේ. | මූල්‍ය අක්‍රමිකතාවය සම්බන්ධයෙන් ද්වී පුද්ගල කමිටුවක් මගින් මූලික විමර්ශණය පවත්වන ලදී. එම වාර්තාව තේ පර්යේෂණ මණ්ඩල රැස්වීම වෙත යොමු කිරීමට කටයුතු කරන ලද අතර එහි තීරණයන් වූයේ වතු අධිකාරී, ප්‍රධාන ලිපිකරු සහ කණිෂ්ඨ සහකාර ලිපිකරු යන අයගේ වැඩ තහනම් කරමින් චෝදනා නිකුත් කරන ලෙසටයි. ඒ අනුව එම චූදිතයන් තිදෙනා වෙත චෝදනා පත්‍රයන් නිකුත් කරන ලද අතර විනය පරීක්ෂණයන් පවත්වා විනය නියෝගයන් ලබා දීම සිදු කර ඇත.<br>Covid-19 වසංගත තත්ත්වය හේතුවෙන් හිටපු ප්‍රධාන ලිපිකරුගේ සහ කණිෂ්ඨ සහකාර ලිපිකරුගේ අවසන් විමර්ශන වාර්තා ලබා දීමේ ප්‍රමාදයක් සිදු විය. ආයතනය විසින් ඉහත කරුණ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ වාණිජ අපරාධ පරීක්ෂණ ඒකකය වෙත පැමිණිල්ලක් ගොනු කර ඇත. තවද මේ වන විට නුවරඑළිය මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක B/611/2019 යටතේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් කරුණු වාර්තා කර ඇත. මුරෙ (104) සහ මුරෙ (105) වාර්තාවන් ලබා ගැනීම සිදු කර ඇත.<br>තවද මෙම මූල්‍ය අක්‍රමිකතාවය සම්බන්ධයෙන් කණිෂ්ඨ සහකාර ලිපිකරුට එරෙහිව ආයතනය මගින් | මූල්‍ය වංචාව සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු ප්‍රමාදයකින් තොරව අවසන් කිරීමට සහ විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමටද, නඩු තීන්දු අනුව අවශ්‍ය කටයුතු කිරීමද කළ යුතුය. |

| | | |
|---|---|---|
| | | සිවිල් නඩුවක් ගොනු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට නීතිපති දෙපාර්තමේන්තුව වෙත අදාළ ලිපි ලේඛන යොමු කර ඇත. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මණ්ඩලයේ අනුමත කාර්යය මණ්ඩලය තුළ ජ්‍යෙෂ්ඨ කළමණාකරණ තනතුරු 36 ක් පැවතියද සමාලෝචිත වර්ෂයේදී ඉන් තනතුරු 26 ක් පුරප්පාඩුව පැවතුණි. එම පුරප්පාඩු අතර අංශ ප්‍රධානී තනතුරු 04 ක්ද ප්‍රධාන පර්යේෂණ නිලධාරී තනතුරු 13 ක්ද ප්‍රධාන උපදෙස් නිලධාරී තනතුරු 05 ක්ද අභ්‍යන්තර උසස්වීම් මඟින් පිරවිය යුතු පුරප්පාඩු වන අතර සුදුසුකම් සහිත නිලධාරීන් නොසිටීම හේතුවෙන් වර්ෂ 02 ට වැඩි කාලයක සිට පුරප්පාඩුව පැවතුනි. එමෙන්ම මෙහෙයුම් සහ උපදෙස් නිලධාරී තනතුරුවලින් සියයට 52 ක්ද තාක්ෂණ හා තාක්ෂණික නොවන කළමණාකරන සහකාර තනතුරුවලින් සියයට 63 ක්ද පුරප්පාඩුව පැවතුණි. | ප්‍රධාන පර්යේෂණ නිලධාරී තනතුර අභ්‍යන්තර උසස්වීමක් වන අතර සුදුසුකම් සපුරාලූ නිලධාරීන් සඳහා 2022 අගෝස්තු මස අයදුම්පත් කැඳවා ඇත. ප්‍රධාන උපදෙස් නිලධාරී තනතුර අභ්‍යන්තර උසස්වීමක් වන අතර එම තනතුරු සඳහා තේ පර්යේෂණ ආයතනයේ අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුව සුදුසුකම් සම්පූර්ණ කළ අභ්‍යන්තර අයදුම්කරුවන් නොමැත. | පුරප්පාඩුව පවතින අනුමත කාර්යය මණ්ඩලයේ අත්‍යවශ්‍ය තනතුරු කඩිනමින් බඳවාගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) අනුමත කාර්යමණ්ඩලය තුළ කාර්යභාර නිලධාරී (OIC) තනතුරු නොමැති වුවද එම තනතුරුවල වැඩ බැලීම සඳහා නිලධාරීන් 06 දෙනෙකු පත්කර වැඩ බැලීමේ දීමනා ලෙස සමාලෝචිත වර්ෂය තුළදී රු. 360,000ක් වැයකර තිබුණි. මේ සඳහා 2010 වර්ෂයේ සිට මේ දක්වා වැයකර ඇති මුළු මුදල රු. 4,073,802 ක් විය. | ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය තුළ ස්ථාන භාර නිලධාරී යනුවෙන් තනතුරු පිහිටුවා නොමැති අතර, සේවා කටයුතු පහසුකර ගැනීමට හා විධිමත්ව පවත්වාගෙන යාම සඳහා එම තනතුරු නාමයන් භාවිත කරනු ලබයි. ස්ථාන භාර නිලධාරී තනතුරු වල රාජකාරි කටයුතු සිදු කරනු ලබන්නේ අනුමත කාර්ය මණ්ඩලය තුළ පවතින ප්‍රධාන පර්යේෂණ නිලධාරි, උපදෙස් නිලධාරි හා ව්‍යාප්ති නිලධාරි තනතුරු වල සිටින නිලධාරීන් වේ.<br>ස්ථාන භාර නිලධාරීන් විසින් පැය 24 පුරාම අදාළ මධ්‍යස්ථානයේ කටයුතු වලට අදාළව වගකීම දරනු ලබයි. තවද උපදෙස් හා ව්‍යාප්ති කටයුතු, පර්යේෂණ සහ පරිපාලන කටයුතු, තේ පර්යේෂණ ආයතනය මගින් සිදු කරනු ලබන ආදායම් උත්පාදන ව්‍යාපෘති | දීමනා සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය.ආයතනයේ අවශ්‍යතාවයට සරිලන ලෙස අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කරවා ගත යුතුය. |

| | | |
|---|---|---|
| | සම්බන්ධීකරණ කටයුතු, නිලධාරින් හා සේවකයින් අධීක්ෂණ කටයුතු, චෙක්රෝල් සේවකයින්ගේ වැටුප් ගෙවීම් කටයුතු සහ කාර්යාලය පරිශ්‍රයේ ආරක්ෂක කටයුතු පිළිබඳ වගකීම දැරීම ස්ථාන භාර නිලධාරී විසින් සිදු කරනු ලබයි. සිය තනතුරු වලට නියමිත රාජකාරි කටයුතු වලට අමතරව සිදු කරනු ලබන ස්ථාන භාර නිලධාරී රාජකාරි වෙනුවෙන් තේ පර්යේෂණ මණ්ඩල අනුමැතියට යටත්ව අදාල දීමනාව ගෙවනු ලබයි.<br>අදාළ දීමනාව ගෙවීම අනුමත කර ගැනීම සඳහා වැවිලි අමාත්‍යාංශය මඟින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ලිපියක් යොමු කර ඇති අතර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ. එසේම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියට යටත්ව ස්ථාන භාර නිලධාරී තනතුරක් ඇති කර අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් කිරීමට බලාපොරොත්තු වේ. | |
| (ඇ)2014 නොවැම්බර් 12 දිනැති අංක 25/ 2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි තාවකාලික හෝ අනියම් පදනම මත බඳවාගෙන තිබුණු දින 180 ඉක්මවූ සේවකයින් 92 ක් 2014 ඔක්තෝබර් 24 දින සිට ක්‍රියාත්මක වන පරිදි ස්ථිර පත්වීම් ලබාදී තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම මණ්ඩලයේ කාර්යය මණ්ඩලයට ඇතුළත් කිරීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014 අනුව ස්ථිර පත්වීම් ලබා ඇති නමුත් එහි නිත්‍යානුකූලභාවය පිළිබඳ ගැටලු පවතින සේවකයින් සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමර්ග ගැනීම පිළිබඳව අවශ්‍ය උපදෙස් ඉල්ලා වැවිලි අමාත්‍යාංශය වෙත ලිපියක් යොමුකර ඇත. | 2014 වර්ෂයේ පත්වීම් ලබාදුන් සේවකයින් කාර්යය මණ්ඩලයට ඇතුළත් කරගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ ක්‍රියාකාරී සැලැස්මේ දැක්වෙන දැනට ක්‍රියාත්මක වන පර්යේෂණ ව්‍යාපෘති 101 ක් පැවතුනි. විගණනය වෙත ඉදිරිපත් කර තිබුණු තොරතුරුවලට අනුව 2013 | තේ, රබර්, පොල් සහ උක් පර්යේෂණ ආයතන වල සාමූහිකත්වයෙන් වසර 2කට වරක් එළිදක්වන වැවිලි බෝග පර්යේෂණ පිළිබඳ ශාස්ත්‍රීය සම්මන්ත්‍රණය (Plantation Crop Research Symposium) 2021 වසරේ දී | කල් දමා හෝ අතහැර දමා තිබුණු පර්යේෂණ ව්‍යාපෘති ඇතුළුව සියලු ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදිත මුදල් |

වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ආරම්භ කර තිබුණු පර්යේෂණ ව්‍යාපෘති අතරින් තේ ක්ෂේත්‍රයේ නිපුණත්වය සහිත මානව සම්පත් හිඟතාවය නිසා 2021 වර්ෂය වන විට පර්යේෂණ ව්‍යාපෘති 07 ක් ද විවිධ හේතූන් මත රු. 40,498,203 ක් වැය කළ පර්යේෂණ ව්‍යාපෘති 26 ක්ද කල් දමා හෝ අතහැර දමා තිබුණි. එසේම 2014 සහ 2015 වර්ෂවලදී සිදුකළ යුතු බවට හඳුනාගත් පර්යේෂණ ව්‍යාපෘති 03 ක් මූල්‍ය සහ ශ්‍රම සම්පත හිඟවීම හේතුවෙන් ආරම්භ නොකරම අතරමග නවතා දමා තිබුණු අතර පර්යේෂණ සම්බන්ධයෙන් ප්‍රසිද්ධ කිරීම්, ප්‍රදර්ශණ සහ සම්මන්ත්‍රණ (Symposium) පැවැත්වීම සඳහා සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රතිපාදනය වූ රු. 2,500,000 න් සියයට 89 ක් උපයෝජනය කර නොතිබුණු අතර පසුගිය වර්ෂ 02-03 තුළ සම්මන්ත්‍රණ (Symposium) පවත්වා නොතිබුණි.

තේ පර්යේෂණ ආයතනය මූලිකත්වයෙන් සිදු කිරීමට යෝජිත වුව ද, 2020 - 2021 වසරවල දී ලොව සියළු එදිනෙදා කටයුතු වලට හා රාජකාරී කටයුතු වලට බලපෑ Covid 19 වසංගත තත්ත්වයේ අවධි 3 හමුවේ හා තේ පර්යේෂණ ආයතනය ද මසක පමණ කාලයක් වසා දමා තිබීම (lockdown ) හේතුවෙන් වැවිලි බෝග පර්යේෂණ පිළිබඳ ශාස්ත්‍රීය සම්මන්ත්‍රණ සාකච්ඡා මෙහෙයවීම සහ සංවිධානය අපහසු කටයුත්තක් විය.

එසේ වුව ද, රේඛීය අමාත්‍යාංශය හා අනෙකුත් පොල්, රබර්, උක් පර්යේෂණ ආයතන වල සභාපතිවරුන් හා අධ්‍යක්ෂකවරුන්ගේ හමුවක් කැඳවා ඉදිරි වසරක දී පැවැත්වීමට ද සැලසුම් කෙරේ. තව ද, තේ පර්යේෂණ ආයතනය මැදිහත්ව තේ සඳහා ජාත්‍යාන්තර මට්ටමේ සම්මන්ත්‍රණයක් ද පැවැත්වීමට යෝජිත ය.

කාර්යක්ෂමව උපයෝජනය කිරීම සහ වඩාත් ඵලදායී තොරතුරු සමාජගත කිරීමට යෝග්‍ය පියවර ගත යුතුය.